# චීවරකරණය හා භාවිතය පිළිබඳ විමසුමක්

## Introduction on Cīvarakaraṇa and its Usage

පහලගම ධම්මික හිමි


## Abstract

The dress worn by a monk is called a cīvaraṃ or a robe. The ordination is performed only by ordained priests. The cīvara (robe) is highly regarded in Sri Lankan culture. There is a discipline associated with making a cīvara. That is why it is disciplined. Many of the things a monk uses are disciplinary. Of these, cīvara usage is disciplinary for several reasons. Unlike lay people, a monk cannot choose a cloth for a cīvara according to his taste. The same goes for color. The cīivara can be made by choosing the type and color of the fabric without exceeding the size of the Buddha's recognition. It is common to all three robes used by a monk. Selection of fabric in the cīivarakaraṇa (making robes) is done by cutting, sewing and weaving. After that, determination (adhiṭṭhānaṃ), falls into a discussion about the robe (vikappanaṃ) and, regular form of investiture (paccuddharati) are done. In the process of daily use of the person, there is no such thing as clothing and other things that are made with as much care and respect as cīvara. The discipline of the cīvara is the same as that of the wearer. Historically, the understanding of the Vinaya Piṭaka about the evolution of the cīvara and its use is extremely important to the life of a bhikkhu. Not only sound identification but also how it is used is important here. Analysis of the structure of the consecrated and not consecrated is pointed out in the Vinaya. Cīvara is not just a prelude to beauty, but a matter of four-way requirements of a bhikkhu for access to the path of Nibbāna.

**Keywords:** Vinaya, Cīvara, Cīvarakaraṇa, Vastra, Randan

**සාරසංක්ෂේපය**

භික්ෂුව පෙරවන වස්ත්‍රය හඳුන්වන්නේ සිවුර යන නමිනි. සිවුර පෙරවීම සිදු කරන්නේ පැවිදි වූ අය පමණි. චීවරය ඉමහත් ගෞරවයට පත්වී තිබීම ලාංකේය සංස්කෘතියේ දී සුවිශේෂී වේ. වස්ත්‍රය චීවරයක් බවට පත්වීමට විනය හා සම්බන්ධ වූ ක්‍රමවේදයක් පවතී. ඊට විනයානුකූල බවක් ඇති වන්නේ එබැවිණි. භික්ෂුවගේ පරිහරණයට ඇති බොහෝ දෑ විනයානුකූල වේ. ඉන් චීවර පරිහරණය කරුණු කීපයක් හේතුවෙන් විනයානුකූල වේ. ගිහි ජනයා මෙන් භික්ෂුවට තමාගේ රුචිකත්වය මත චීවරයක් සඳහා රෙදි තෝරාගත නොහැකිය. වර්ණය ද එසේ ය. බුදුරදුන් ගේ අනුදැනීමේ ප්‍රමාණය නො ඉක්මවා රෙදි වර්ගය හා වර්ණය තෝරාගෙන චීවරය සකස් කොට හැකිය. භික්ෂුව පාවිච්චි කරන තුන් සිවුරට ම එය පොදු වේ. චීවරකණයේ දී රෙදි තෝරාගැනීම කැපීම මැසීම පඬු ගැසීම සිදු කරයි. ඉන් පසු අධිෂ්ඨාන විකප්පන හා පච්චුද්ධරණ ආදිය සිදු කරයි. පුද්ගලයා දෛනිකව සිදු කරන පරිහරණ ක්‍රියාවලියේ දි චීවරකරණය තරම් උවමනාවෙන් හා ගෞරවයෙන් සකස් කර ගන්නා ඇඳුම් පැලඳුන් හා වෙනත් දෑ හමු නොවෙයි. චීවරයේ විනයානුකූල බව එය දරන්නාට සමාන වේ. ඓතිහාසිකව චීවරයේ විකාශනය හා එහි පරිහරණය පිළිබඳ විනය පිටකයේ අනුදැනීම අතිශය භික්ෂු දිවියට වැදගත් වේ. හැඳීම් පෙරවීම් පමණක් නොව පරිහරණය සිදු කරන ආකාරය මෙහි දී වැදගත් වේ. කැප හා අකැප චීවරයේ සැකැස්ම පිළිබඳ විග්‍රහයන් විනය තුළ පෙන්වා දී තිබේ. චීවරය හුදෙක් අලංකාරය සඳහා වූ පෙරවීමක් නොවන බවත් නිර්වාණගාමී මාර්ගයට ප්‍රවේශය සඳහා වූ සිවුපස පරිභෝගයට අදාල කාරණයක් වේ.

**යතුරු පද:** විනය, චීවරය, චීවරකරණය, වස්ත්‍ර, රඳන්

**හැඳින්වීම**

චීවරකරණය පිළිබඳ විනය පිටකාගත ඉගැන්වීම හා සම්බන්ධ සිදු කරන අධ්‍යයනයකි. භික්ෂුවගේ පාරුපනය සඳහා භාවිත චීවරය විනයානුකූලව සකස් කර ගන්නේ කෙසේ ද යන්න

මෙමගින් අනාවරණය වේ. මුල් කාලීන භික්ෂුව විසින් චීවරය භාවිත කළ අකාරයත් විවිධ අවශ්‍යතා අනුව චීවරය ක්‍රමානුකූලව සකස් වූ ආකාරයත් මෙහි දී අධ්‍යයන කෙරේ. චීවරණකරණය ප්‍රායෝගික වූ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වුව ද ඊට න්‍යායික දැනුම අවශ්‍ය වේ. මෙම අධ්‍යයනය ගුණාත්මක අධ්‍යයනයකි. ඒ සඳහා ග්‍රන්ථ සන්ධාර ක්‍රමය මගින් ආදල දත්ත සපයා ගනු ලබයි. එකී දත්ත විශ්ලේශිතව කරුණු පෙලගස්වා පර්යේෂණය සිදු කරනු ලබයි.

## සාහිත්‍යය විමර්ශනය

මෙම ශාස්ත්‍රීය පර්යේෂණයේ දී උසස් පර්යේෂණයක් එළිදැක්වීම සඳහා සාහිත්‍යය විමර්ශනය වැදගත් වේ. මහාවග්ගපාළි II, චීවරක්ඛන්ධකය බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006. මෙම ලිපිය සඳහා ප්‍රධාන මූලාශ්‍රය වශයෙන් භාවිත කෙරේ. රේරුකානේ චන්දවිමල නාහිමියන් විසින් රචිත ශාසනාවතරණය, ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය මගින් 1960 ප්‍රකාශිත කෘතියේ දී සිවුරු හැඳීම හා පෙරවීම යනු මාතෘකාවේ දී චීවරයේ භාවිතය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කොට තිබේ. එසේ ම උන්වහන්සේ විසින් 1956 රචිත උභය ප්‍රාතිමෝක්ෂය කෘතියේ දී චීවර පරිහරණය පිළිබඳ ශික්ෂා දක්වා තිබේ. උන්වහන්සේගේ ම කෘතියක් වන 2008 පුනර් මුද්‍රිත උපසම්පදා ශීලය කෘතියේ දී සිවුරු පිළිබඳ ශික්ෂා පද මාතෘකාවේ දි චීවර පරිහරණය පිළිබඳ විස්තර දැක්වේ. උන්වහන්සේ විසින් රචිත විනය කර්ම අත්පොත 2008 නව වන මුද්‍රණයේ ද චීවර පිළිබඳ තොරතුරු වේ. උක්ත ග්‍රන්ථාගත තොරතුරු ආධාර කොට චීවර සකස් කර ගැනීම හා ඊට අදාළ භාවිතයන් පිළිබඳ පැහැදිලි කිරීම මෙහි දී සිදු කෙරේ.

## සාකච්ඡාව

සිවුර හෙවත් චීවරය භික්ෂුව පෙරවීම සඳහා භාවිත කරන වස්ත්‍රය වෙයි. සංස්කෘත භාෂාවෙන් චීර යනුවෙන් අදහස් කරන්නේ ගස්වලින් ගලවාගත් පට්ටාය. එකී අර්ථයෙන් ම පාලි භාෂාවෙන් චීවරය හඳුන්වයි. රෙදි කැබලි එක් කොට සකස් කර ගත් වස්ත්‍රය යන අර්ථයෙන් ද චීවර ලෙස හඳුන්වයි. චීවර යනුවෙන් හඳුන්වන්නේ කහට හෙවත් කසට පෙවූ වස්ත්‍රයයි. භික්ෂුවගේ පාරුපනය සඳහා

භාවිත කරන වස්ත්‍රයකි. බුද්ධ කාලීන භාරතීය සමාජයේ ශ්‍රමණ බ්‍රාහ්මණ කොට්ඨාශ මෙබඳු වස්ත්‍ර සකස් කොට ගෙන පාවිච්චි කොට තිබේ. මෙම වස්ත්‍රයේ වටිනාකමක් නැත්තේ ය. රෙදි කැබලි එක්කොට සකස් කොට ඇති බැවින් එහි වටිනාකම අඩුවේ. එහෙත් ලොව ඇති පූජනීය වස්ත්‍රය වන්නේ චීවරයයි. අරහත් ධජය යනුවෙන් ද හඳුන්වයි. චීවරය පරිභෝග කරන්නා 'භික්ඛු' යන ව්‍යවහාරයෙන් හඳුන්වයි. ඡින්නභින්නපටධරො (සමන්තපාසාදිකා 48 පිටුව) ආදි වශයෙනි. බුදුරදුන් භික්ෂුවගේ පරිභෝජනය සඳහා සිවුරු අනුදැන ඇත්තේ මහාවග්ගපාළියේ චීවරක්ඛන්ධකයේය.

බුද්ධ කාලීන මහතෙරවරු සොහොනෙන් අහුලාගත් වස්ත්‍ර සිවුරු වශයෙන් මුල් කාලයේ භාවිත කළහ. එකල විශේෂ වශයෙන් සිවුරක් සකස් කර ගන්නා පිළිවෙලක් පිළිබඳ දේශනා කොට නොතිබුණි. ඒ නිසා කිසියම් ආකාරයක වස්ත්‍ර කැබලි සකස් කොට ගෙන සිවුර ලෙස භාවිත කොට තිබේ. ජීවක කෝමාරභච්චයන්ට කිසියම් කාලයක පජ්ජෝත රජුට වැලඳුන පාණ්ඩු රෝගය සඳහා ප්‍රතිකාර කරන්නට අවස්ථාව උදාවිය. එකී ප්‍රතිකාරයෙන් නීරෝගී වූ පජ්ජෝත රජු ජීවක වෛද්‍යවරයාට සීවෙය්‍යකවස්ත්‍ර යුගලයක් තෑගි කළේය. මෙම වස්ත්‍ර යුගලය බොහෝ සිය දහස් ගණන් අගයෙන් වටින්නේය. එසේම ශ්‍රේෂ්ඨ උතුම් අග්‍ර වස්ත්‍ර යුගලයක් වන්නේය. බහූනං දුස්සානං බහූනං දුස්සයුගානං බහූනං දුස්සයුගසතානං බහූනං දුස්සයුගසහස්සානං බහූනං දුස්සයුගසතසහස්සානං අග්ගඤ්ච සෙට්ඨඤ්ච මොක්ඛඤ්ච උත්තමඤ්ච පවරඤ්ච. පටිග්ගණ්හාතු මෙ, භන්තෙ, භගවා සිවෙය්‍යකං දුස්සයුගං (මහාවග්ගපාළි 692 පිටුව.) සීවෙය්‍යක වස්ත්‍ර යුගලය වටිනාකමින් අධිකය. ජීවකකෝමාරභච්චයන් සිතනුයේ සීවෙය්‍යක වස්ත්‍ර භාවිතය සුදුසු වන්නේ සේනිය බිම්බිසාර රජු හෝ බුදුරදුන් පමණක් බවයි. නයිදං අඤ්ඤො කොචි පච්චාරහති අඤ්ඤත්‍ර තෙන භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන, රඤ්ඤා වා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙනාති. (මහාවග්ගපාළි 692 පිටුව.)

බුදුරදුන්ට වැලඳුනු වාතාබාධයට ප්‍රතිකාර කර එයින් නීරෝගී වූ පසු ජීවක කෝමාරභච්චයන් සීවෙය්‍යක වස්ත්‍ර යුගලය පූජා කරයි. බුද්ධ ප්‍රමුඛ සංඝයා පංසුකූල චීවර දරණ බවත් ගහපති චීවරය අනුදැන වදාරණ ලෙසත් මෙහි දී ජීවක කෝමාරභච්ච ඉල්ලා

සිටියි. එකී ඉල්ලීම නිසා බුදුරදුන් අනුජානාමි භික්ඛවෙ ගහපතිචීවරං. (මහාවග්ගපාළි, 696 පිටුව.) යනුවෙන් ගහපති චීවරය අනුදැන තිබේ.

### චීවර වර්ග

බුදුරදුන් භික්ෂුවගේ පාවිච්චිය සඳහා අනුදැන ඇති චීවරය කොටස් තුනකින් යුක්තය. සංඝාටි (දෙපට සිවුර) උත්තරාසංග, (තනිපට සිවුර) අන්තරවාසක (අඳන සිවුර) යනු ඒවාය. උත්තරාසංගය භික්ෂුවගේ උඩුකය වසනු පිණිස පොරෝනා සිවුරය. සංඝාටිය භික්ෂුවක් විහාරයෙන් පිටත යන කල්හි ශරීරය හොඳින් වසාගනු පිණිස පාවිච්චි කරන සිවුරය. අන්තරාවාසකය භික්ෂුව අඳින අඳනයයි. තනිපට සිවුර දෙපට සිවුර හා අඳනය භික්ෂුවගේ පාවිච්චිය සඳහා භාවිත වන සිවුරු වෙයි. ප්‍රධාන වශයෙන් සිවුරු වර්ග තුනක් හමුවෙයි.

පංශුකූල චීවරය (පංශුකූල චීවරං)

ගෘහපති චීවරය (ගහපති චීවරං)

කඨින චීවරය (කඨින චීවරං)

පංශුකූලික යනුවෙන් අදහස් කරන්නේ පස්වලට යට වූ වස්ත්‍ර යන්නයි. බුද්ධ කාලීන භික්ෂුව හා විවිධ ආගමික කණ්ඩායම් පංශුකූල චීවරය භාවිත කරන ලදී. පංශුකූල චීවරය සඳහා වස්ත්‍ර සොයාගත හැකි ස්ථාන 23ක් පිළිබඳ විසුද්ධිමග්ගය පෙන්වා දෙයි. 01. සොහොනෙහි දැමූ වස්ත්‍රය. තත්ථ සොසානිකන්ති සුසානෙ පතිතකං. 02. කඩසාප්පු ඉදිරියේ දැමූ හෝ වැටුණු වස්ත්‍රය. පාපණිකන්ති ආපණ ද්වාරෙ පතිතකං. 03. පින් කැමැත්තවුන් විසින් සුළං කවුළුවෙන් වීථියෙහි දැමූ වස්ත්‍රය. රථියචොළකන්ති පුඤ්ඤත්ථිතෙහි වාතපානද්වාරෙන රථිකාය ඡඩ්ඩිතචොළකං. 04. කසල ගොඩෙහි දැමූ වස්ත්‍රය සඞ්කාරචොළකන්ති සඞ්කාරට්ඨානෙ ඡඩ්ඩිතචොළකං. 05. ස්ත්‍රීන්ගේ ගැබ්මළ පිස දමා ඉවත දැමූ වස්ත්‍රය. සොත්ථියන්ති ගබ්භමල පුඤ්ඡිත්වා ඡඩ්ඩිතවත්ථං. 06. යකැදුරන් විසින් හිස පටන් නහවන ලද්දවුන් කාලකණ්ණි වස්ත්‍රය යැයි අතහැර දැමූ වස්ත්‍රය. නහානචොළන්ති යං භූත වෙජ්ජෙහි යං සසීසං නහාපිතා කාළකණ්ණිචොළන්ති ඡඩ්ඩෙත්වා ගච්ඡන්ති. 07. නාන තොට

හැරදැමූ වස්ත්‍රය. තිත්ථචොළන්ති සිනාන තිත්ථෙ ඡඩ්ඩිත චොළන්ති. (විසුද්ධිමග්ගය, හේවාවිතාරණ මුද්‍රණ, 1919, 47 පිටුව.) 08. සොහොනට ගොස් ආපසු පැමිණි මිනිස්සු ජලස්නානය කොට අතහැර දැමූ වස්ත්‍රය. ගතපච්චාගතන්ති යං මනුස්සා සුසානං ගන්වා පච්චාගතං නහාත්වා ඡඩ්ඩිතන්ත 09. ගින්නෙන් දැවුණු වස්ත්‍රය. අග්ගිදඩ්ඪන්ති අග්ගිනා දඩ්ඪ පදෙසං තං හි මනුස්සා ඡඩ්ඩෙන්ති. 10. ගවයන් කන ලද වස්ත්‍රය. ගොඛායිතාදිනි පාකටානෙව. තාදිසානිපි මනුස්සා ඡඩ්ඩෙන්ති. 11. වේයන් කන ලද වස්ත්‍රය. 12. මීයන් කන ලද වස්ත්‍රය. 13. අග කඩා ගිය වස්ත්‍රය. 14. දහවලු කඩාගිය වස්ත්‍රය. 15. නැව් නගින්නන් ධජයක් බැඳි වස්ත්‍රය. ධජාහටන්ති නාවං ආරුහන්තා ධජං බන්ධිත්වා ආරුහන්ති. 16. තුඹසක් වටකොට බලිකර්ම කිරීමට බැඳි වස්ත්‍රය. ථූපචීවරන්ති වම්මිකං පරික්ඛිපිත්වා බලිකම්මකතං. 17. භික්ෂුව සතු වස්ත්‍රය. සමණචීවරන්ති භික්ඛුසන්තකං. 18. රාජාභිෂේක කළ ස්ථානයේ දමා ගිය වස්ත්‍රය. ආභිසෙකිකන්ති රඤ්ඤො අභිසෙකට්ඨානෙ ඡඩ්ඩිත චීවරං. 19. එහි භික්ඛු උපසම්පදාව ලැබීමේදී ලද චීවරය. ඉද්ධිමයන්ති එහිභික්ඛු චීවරං. 20. මඟ වැටුණු වස්ත්‍රය. පන්ථිකන්ති අන්තරාමග ්ගෙ පතිතකං යං පන සමාමිකානං සතිසම්මොසානෙ පතිතං තං ථොකං රක්ඛිත්වා ගහෙතබ්බං. 21. සුළඟින් ගසාගෙන ගොස් වැටුණු වස්ත්‍රය. වාතාහතන්ති වාතෙන හරිත්වා දූරෙ පතිතං. 22. දෙවියන් විසින් දුන් වස්ත්‍රය. දෙවත්තියන්ති යං අනුරුද්ධථෙරස්ස විය දෙවෙහි දින්නං. 23. මුහුදු රළින් ගොඩ දැමූ වස්ත්‍රය. සාමුද්දියන්ති සාමුද්දවීහි ථලෙ උස්සාදිතං යං පන සංඝස්ස දෙමාති සින්නං. (සමන්තපාසාදිකා ,986 පිටුව.) යන තෙවිසි පංසුකූල වස්ත්‍ර සොයා ගත හැකිය.

ගහපති චීවර නමින් හඳුන්වන්නේ දායකකාරකාදීන් විසින් ශ්‍රද්ධාවෙන් සංඝයාට පූජා කිරීම සඳහා මසා නිම කරන ලද චීවරයි. එසේ ම සිවුරු මසා ගැනීමට පූජා කරන වස්ත්‍රයයි. පූජාකරන්නාගේ අභිමතය පරිදි භික්ෂුවකට හෝ පොදු සංඝයාට හෝ සාංඝික ව පූජා කරන චීවරය ගහපති චීවර වෙයි. මෙම චීවරය මසා නිම කළ චීවර වශයෙන් ද චීවරය මසා ගැනීම සඳහා වස්ත්‍ර ද ගහපති චීවරය පූජා කළ හැකිය. බුදුරදුන්ට පළමුවෙන් ම ගහපති චීවරයක් පූජා කළේ ජීවක කෝමාරභච්ච වෛද්‍යවරයාය. ගහපති චීවර සොයා ගැනීමට අවශ්‍ය නොවෙයි. භික්ෂු සංඝයාට කාලීනව ඇති වූ ගැටලු නිසා බුදුරදුන් ගහපති චීවරය, අතිරේක චීවර ආදිය අනුදැන තිබේ.

පෙර වස් විසූ භික්ෂුවක් වස්සච්ඡේදනය නොවී වප් පුරපසළොස්වක දින පවාරණය කළ යුතුය. ඉන් අනතුරුව සංඝයාට කඨින චීවරයක් වශයෙන් භාවිතයට සුදුසු තුන් සිවුරුවලින් එකක් හෝ වස්ත්‍රයක් පූජා කරයි. සංඝයා විසින් කඨිනාස්තරණය සඳහා සුදුසු භික්ෂුවකට පවරණු ලබයි. කඨිනාස්තාරක භික්ෂුව විසින් අධිට්ඨානය, පච්චුද්ධරණය, අනුමෝදනාව සිදු කරයි. ඒ විනය කර්ම සියල්ල සිදු කිරීමෙන් සම්මත වන විශේෂ සිවුර "කඨින චීවරය" නම් වෙයි. කඨින සිවුර පිළිබඳ තොරතුරු මහාවග්ගපාළියේ කඨිනක්ඛන්ධකයේ අන්තර්ගත වෙයි.

### සිවුරු සඳහා සුදුසු වස්ත්‍ර

බුදුරදුන් භික්‍ෂූන්ට ගහපති චීවරය අනුදැනීමෙන් පසු විවිධාකාරයේ සිවුරු (චීවර) වර්ග සැදැහැතියන් විසින් පූජා කරන්නට වූහ. මේ හේතුවෙන් භික්‍ෂූන්ට සුදුසු (කැප) මොනයම් වස්ත්‍ර වර්ගයක් ද යන විමතිය ඇති විය. එය විමසා සිටි කල්හි බුදුරජාණන් වහන්සේ, අනුජානාමි භික්ඛවෙ, ඡ චීවරානි ඛොමං කප්පාසිකං කොසෙය්‍යං කම්බලං සාණං භඞ්ගන්ති (මහාවග්ගපාළ 698 පිටුව.) යනුවෙන් භික්ෂූන්ට කැප සිවුරු වර්ග සයක් අනුදැන වදාළහ.

කොමු වස්ත්‍ර (ඛොමං)

කපු වස්ත්‍ර (කප්පාසිකං)

පට වස්ත්‍ර (කොසෙය්‍යං)

කම්බිලි වස්ත්‍ර (කම්බලං)

හණ වැහැරි වස්ත්‍ර (සාණං)

මිශ්‍ර වස්ත්‍ර (භඞ්ගං)

භික්ෂූන් වහන්සේලාගේ චීවරකරණයට සුදුසු වස්ත්‍ර වර්ග සය පිළිබඳ මහාවග්ගපාළියේ චීවරක්ඛන්ධකයේ සඳහන් වෙයි. කොමු රෙදි නම්, තත්ථ ඛොමන්ති ඛොමවාකෙහි කතසුත්තං. (සමන්තපාසාදිකා 526 පිටුව.) (කොමු පටට්ා හෝ නූල්වලින් මැසූ වස්ත්‍ර කොමු වස්ත්‍ර

නම් වෙයි) කප්පාසිකන්ති කප්පාසතො නිබ්බත්තං. (කපු පුළුන්වලින් සකස් කළ රෙදි මින් අදහස් කරයි) කොසෙයාන්ති කොසියංසුහි කන්තිත්වා කතසුත්තං. (පට රෙදිවලින් කළ වස්ත්‍රය) කම්බලන්ති එළකලොමසුත්තං. (එළු ලොම් ආදි නූලලෙන් කළ වස්ත්‍ර) සාණන්ති සාණවාකසුත්තං. (හණ නූල්වලින් කළ වස්ත්‍ර) භඞ්ගන්ති පාටෙක්කං වාකසුත්තමෙවාති එකෙ. එතෙහි පඤ්චහි මිස්සෙත්වා කතසුත්තං පන භඞ්ගන්ති වෙදිතබ්බං. (සමන්තපාසාදිකා 526 පිටුව.) (කොමු, කපු, කම්බිලි, හා හණ නූලෙන් කළ රෙදි ආදිය මිශ්‍ර කොට සකස් කළ රෙදිවර්ගයකි) මේ රෙදි වර්ගවලින් කළ වස්ත්‍ර චීවර පිණිස භාවිත කිරීම සුදුසු වෙයි. ගිහි කාමභෝගීන් භාවිත කරන සියලු රෙදි වර්ග චීවර සඳහා අනුදැන නැත.

## සිවුරුවල ප්‍රමාණ

භික්ෂූන් වහන්සේ භාවිත කරන චීවර සකස් වූයේ කුඹුරුයායක සැකැස්මේ ස්වරූපයෙනි. කිසියම් ආකාරයක චීවරයෙහි ආරක්ෂාව හා පැවැත්ම පිළිබඳව සිතා කැලි කපා වෙන් කර මැසීම කළ යුතු බව පෙනෙයි. කොටස් වශයෙන් සිවුරෙහි රෙදි කැබලි මූට්ටු කොට මැසීම සිදු කරන්නට මූලික හේතුව වූයේ මාගධ කෙතෙහි පිහිටීම සිවුරට ආදේශ කර ගැනීමයි. බුදුරදහු රජගහ නුවර වැඩ වාසය කොට දක්ඛිණාගිරිය බලා චාරිකාවෙහි වඩින විට මගධ කෙත දුටුහ. එකී මගධ කෙතේ පිහිටීම මෙසේ විය. අථ බො භගවා රාජගහෙ යථාභිරන්තං විහරිත්වා යෙන දක්ඛිණාගිරි තෙන චාරිකං පක්කාමි. අද්දසා බො භගවා මගධ ඛෙත්තං අච්ඡිබද්ධං පාළිබද්ධං මරියාදබද්ධං සිඞ්ඝාටකබද්ධං, දිස්වාන ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. (මහාවග්ගපාළි 708 පිටුව.) බුදුරජාණන් වහන්සේ මගධ කෙත දැක හතරැස් ලියදි බැන්දා වූ දිගින් හා පළලින් මහ නියර බැන්දා වූ අතරතුර කුඩා නියර බැන්දා වූ සතර හන්දි බැන්දා වූ මගධ කෙත දුටු සේක. දැක බුදුරදහු ආනන්ද තෙරුන් අමතා භික්ෂූන්ගේ සිවුර සකස් කිරීම සඳහා මගධ කෙත උපමා වශයෙන් ගැනීම සුදුසු බව පෙන්වා දුන්හ. බුදුරදුන් දක්ඛිණාග රියෙහි වාසය කිරීමෙන් පසු රජගහ නුවර වාසය කරන කල්හි ආනන්ද තෙරුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට චීවරය සංවිධානය කොට එය බුදුරදුන්ට පෙන්වූහ. එහි දී බුදුරදුන් විසින් ආනන්ද තෙරුන් ඇගයීමට ලක් කෙරිණි. භන්තෙ, භගවා චීවරානි සංවිදහිතානීති. අථ

ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි පණ්ඩිතො, භික්ඛවෙ, ආනන්දො මහාපඤ්ඤො, භික්ඛවෙ, ආනන්දො (මහාවග්ගපාළි 708 පිටුව.) ඉන් අනතුරුව බුදුරජාණන් වහන්සේ චීවරයෙහි ස්වභාවය පැහැදි කළහ. එයින් චීවරයක පැවැතිය යුතු හා මැසිය යුතු ක්‍රමය පෙන්වා දෙයි. යත්‍ර හි නාම මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානිස්සති. (මහාවග්ගපාළි, 708 පිටුව.) සංක්‍ෂිප්ත ආකාරයෙන් බුදුරදුන් විසින් දේශනා කළ දේශනාව විස්තර වශයෙන් චීවරයේ නිමාව දක්වා සිදු කළ ආකාරය මෙයින් ප්‍රකාශ වෙයි. චීවරයක් සැකසීමට නම් අවශ්‍ය කැප රෙදි කපා ගත යුතුයි. ඒ සඳහා කපාගන්නා අවස්ථා මෙසේය.

කුසිම්පි නාම කරිස්සති - දිගට හා පළලට යොදන (දිග්පත්) නුවා

අඩ්ඪකුසිම්පි නාම කරිස්සති - කෙටිපත් (හරස් නුවා)

මණ්ඩලම්පි නාම කරිස්සති - මහමැඩිල්ල

අඩ්ඪමණ්ඩලම්පි නාම කරිස්සති - කුඩා මැඩිල්ල

විවට්ටම්පි නාම කරිස්සති - වස් අත්ත

අනුවිවට්ටම්පි නාම කරිස්සති - මැද කඩ

ගීවෙය්‍යකම්පි නාම කරිස්සති - ගෙල පටිය

ජඞ්ඝෙය්‍යකම්පි නාම කරිස්සති - ජංගා පටිය

බාහන්තම්පි නාම කරිස්සති - බාහය

සිවුරක දික් අතට ද පළල අතට ද යෙදෙන දික්පත් (නුවා) කුසී නම් වේ. අතරතුර යොදනා කෙටිපත් (හරස් නුවා) අඩ්ඪකුසී නම් වේ. සිවුරක එක් එක් කඩයෙහි යෙදෙනා මහමැඩිල්ල මණ්ඩලං නම් වේ. කුඩාමැඩිල්ල අඩ්ඪමණ්ඩලං නම් වේ. විවටය යනු වස් අත්තයි. එනම් පසුකඩ සිවුරක මහමැඩිල්ලත් කුඩාමැඩිල්ලත් එකට කොට මසනු ලබන මැද කඩය යි. අනුවිවටය යනු ඒ මැද කඩ දෙපසින්

ඇති කඩ දෙකයි. ඒවා ඇළ අතු නමින් ද හැඳින්වේ. ගීවෙයාකය යනු සිවුරේ ඉහළ වාටියෙහි මසන ලද රෙදි පටියයි. එනම් ගෙලපටියයි. එයින් සිවුරේ ආරක්ෂාව ඇති වෙයි. දහඩිය ආදියට ඔරොත්තුදීම සඳහා අනුදැන ඇති බව පෙනෙයි. ජඞ්ඝෙයාකය යනු සිවුර සිවුරේ පහළ වාටියේ මසන ලද රෙදි පටියයි. බිම ඇතිල්ලීම ආදියට ඔරොත්තුදීම සඳහා බෙහෙවින් භාවිත වෙයි. අනුවිවටයන්ට පිටින් ඇති එක් එක් කඩ බාහන්තං නම් වේ.

වර්තමානයෙහි පොරෝන චීවරයේ සැකැස්ම සිදු වූයේ මේ ආකාරයෙනි. ඒ සඳහා විශේෂ වශයෙන් මගධ කෙත තේමා කොට ගෙන එහි සැකැස්මට අනුව සකසා ඇති බව පෙනෙයි. කැප චීවරයෙහි ස්වභාවය මෙයින් පැහැදිලි වෙයි. චීවරයක් සැකසීමේ දී විනයානුකූල ක්‍රමයක් අනුගමනය කළ යුතු වෙයි.

## සිවුරු සඳහා අකැප වර්ණ

එක්තරා භික්ෂුවක් බුදුරදුන් සමීපයට නග්ගනව පැමිණ තමාගේ අල්පේච්ඡ බව ප්‍රකාශ කළේය. එහි දී බුදුරදුන් නග්න බව තීර්ථක ව්‍රතයක් බව පෙන්වා දී එසේ නග්නව වාසය කරන්නේ නම් තුලැසි බව පෙන්වා දී තිබේ. ඉන් පසු කුස වැහැරි, වා වැහැරි, පෝරු වැහැරි, කෙස් කම්බිලි, සැඩ මුව ලෝමයෙන් කළ කම්බිලි, බකමූණු පියපත්, අඳුන්දිවි සම්වලින් සකස් කළ සිවුරක් පෙරවීම නිසා එයත් සුදුසු නොවන බව පෙන්වා දී තිබේ. ඉන් පසු භික්ෂුවක් වරා නූලෙන් හා නියඳ වැහැරින් කළ සිවුරක් ඇඳ, බුදුරදුන් හමු වූයේය. එයත් නුසුදුසු බව පෙන්වා දී තිබේ. ඡබ්බග්ගිය මහණුන් විසින් සම්පූර්ණයෙන් ම නිල් පාට, සම්පූර්ණයෙන් රතු පාට, මදිටිය පාට, කලු පාට, රතුවැපිට පාට, මිශ්‍ර පාට, නො කැපූ දාවලු (වාටිය) ඇති සිවුරු, දිග දාවලු ඇති සිවුරු, මල් දාවලු ඇති සිවුරු, පෙණ සේ ගෙතූ දාවලු ඇති සිවුරු, සැටට් (අගිය) ගස් සුඹුළු (තිරරීටක) තිහිරිපිළි (සාසනතිලක හිමි,) හිස්වෙළුම ආදිය භාවිත කිරීම හේතු කොට ගෙන අකැප සිවුරු වර්ණ හා අකැප සිවුරු පිළිබඳ උපදෙස් දී තිබේ.

සිවුරු වර්ණය නම් සිවුරේ පාටයි. සිවුරු සකස් කිරීමේ දී සැලකිය යුතු තවත් වැදගත් කරුණක් වන්නේ සිවුරු වර්ණයයි. බුදුරදහු චීවරක්ඛන්ධකයේ සිවුරු සඳහා අකැප වර්ණ සතක් (7) වදාළ සේක. න, භික්ඛවෙ, සබ්බනීලකානි චීවරානි ධාරෙතබ්බානි, න සබ්බපීතකානි චීවරානි ධාරෙතබ්බානි, න සබ්බලොහිතකානි චීවරානි ධාරෙතබ්බානි, න සබ්බමඤ්ජිට්ඨකානි චීවරානි ධාරෙතබ්බානි, න සබ්බකණ්හානි චීවරානි ධාරෙතබ්බානි, න සබ්බමහාරඞ්ගරත්තානි චීවරානි ධාරෙතබ්බානි, න සබ්බමහානාමරත්තානි චීවරානි ධාරෙතබ්බානි, යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සාති. (මහාවග්ගපාළි 742 පිටුව.) යනුවෙනි.

නිල් වර්ණය

කහ වර්ණය

රතු වර්ණය

මදටිය වර්ණය

කළු වර්ණය

රත්වැපිට වර්ණය

පණ්ඩුපලාස වර්ණය

යන වර්ණයන්ගෙන් යුතු සිවුරු අකැප වේ. චීවර වර්ණ පිළිබඳ විනිශ්චය සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ චම්මක්ඛන්ධකයේ පාවහන් පරිහරණය පිළිබඳ කරුණු සඳහන් ස්ථානයේ දී ඒ පිළිබඳ විස්තර හමුවෙයි.

සම්පූර්ණ වශයෙන් නිල් වර්ණය යනු දියබෙරළිය මලේ වර්ණය වෙයි. (සබ්බනීලිකාති සබ්බාව නීලිකා. තත්ථ ච නීලිකා උමාපුප්ඵවණ්ණා හොති,) සම්පූර්ණ වශයෙන් කහ වර්ණය යනු කිණිහිරි මලේ වර්ණයයි. (පීතිකා කණිකාරපුප්ඵවණ්ණා) සම්පූර්ණ වශයෙන් රතුපැහැය යනු බඳුවද මලේ වර්ණයයි. (ලොහිතිකා ජයසුමනපුප්ඵවණ්ණා) මදටිය ඇටයේ වර්ණය (මඤ්ජිට්ඨිකාමඤ්ජිට්ඨවණ්ණා එව) කළු

වර්ණය යනු පෙණල ඇටයේ වර්ණය (කණ්හා අද්දාරිට්ඨකවණ්ණා) රත්වැයාපිට වර්ණය යනු පත්තෑයාගේ පිට වර්ණයයි. (මහාරඞ්ගරත්තා සතපදිපිට්ඨිවණ්ණා) පණ්ඩුපලාස වර්ණය යනු මිශ්‍ර වර්ණයයි. (මහානාමරත්තා සම්භින්නවණ්ණා හොති පණ්ඩුපලාසවණ්ණා) වර්ණය පිළිබඳ යම් යම් වස්තූන් මඟින් අර්ථය ගම්‍ය කොට තිබෙන බව පෙනෙයි.

## පඬු වර්ග

සිවුරු පඬු පෙවීම හෙවත් සිවුරු රදන් ගැන්වීම තුළින් සිදු කරනුනේ සිවුරෙහි වර්ණය සකස් කර ගැනීමයි. පංසුකූලිකව හෝ ගහපති චීවර වශයෙන් හෝ ලද යම් සිවුරක් වෙත් නම් කලින් කලට පඬු පොවා වර්ණ ගන්වා ගත යුතුය. එයින් සිවුර වර්ණවත් වීම පිණිස නොව එහි පවත්නා අගය අඩුවීම පිණිස වෙයි. එසේ සෞඛ්‍යසම්පන්න බව පිණිස වෙයි. මුල් යුගයේ භික්ෂූහු ගොමින් ද පඬුවන් මැටියෙන් ද සිවුරු පඬු පෙවීම සිදු කළහ. එකී ආකාරයෙන් පඬු පෙවූ සිවුරු දුර්වර්ණ විය. ඒ බව බුදුරදුන් දැන ගත් කල අනුජානාමි, භික්ඛවෙ, ඡ රජනානි මූලරජනං, ඛන්ධරජනං, තචරජනං, පත්තරජනං, පුප්ඵරජනං, ඵලරජනන්ති. (මහාවග්ගපාළි 706 පිටුව.) යනුවෙන් පඬු වර්ග සයක් අනුදැන තිබේ. ඒවා සිවුරු පඬු පෙවීම සඳහා භාවිත කොට තිබේ.

මුල් පඬු

දඬු පඬු

පොතු පඬු

කොළ පඬු

මල් පඬු

ඵල පඬු

යන පඬු වර්ග සයයි. මේවා ගසේ මුල්වලින් දඬුවලින් පොතුවලින් කොළවලින් මල්වලින් ගෙඩිවලින් සකස් කර යුතු පඬු වර්ග වෙයි. ගස් මුල්වලින් පඬු සාදා ගැනීමේ දී කහ අල සුදුසු

නොවන වෙයි. මූලරජනාදීසු හලිද්දිං ඨපෙත්වා සබ්බං මූලරජනං වට්ටති. (සමන්තපාසාදිකා 835 පිටුව.) වෙනිවැල් හා තුංගාහාර හැර සියලු දඬු සිවුරු පඬු පෙවීම සඳහා සුදුසු වෙයි. මඤ්ජිට්ඨිඤ්ච තුඞ්ග හාරඤ්ච ඨපෙත්වා සබ්බං ඛන්ධරජනං වට්ටති. තුඞ්ගහාරො නාම එකො සකණ්ටකරුක්ඛො, තස්ස හරිතාලවණ්ණං ඛන්ධරජනං හොති. (සමන්තපාසාදිකා 835 පිටුව.) සිවුරු පඬු පෙවීම සඳහා ගස් පොතු අතර ලොත් (ලොද්ද) පොතු නොගනී. ලොද්දඤ්ච කණ්ඩුලඤ්ච ඨපෙත්වා සබ්බං තචරජනං වට්ටති. (සමන්තපාසාදිකා 835 පිටුව.) ලොත් ගස යන්නට ශ්‍රී සුමංගල ශබ්දකෝෂය අර්ථ දී ඇත්තේ ලොධ්‍ර ගස, යනුවෙනි. (සෝරත හිමි, 892 පිටුව.) මහා සිංහල ශබ්දකෝෂයේ, හරිස්චන්ද්‍ර විජයතුංග සුඹුලු වැනි පොතු ඇති ගසක් බව දක්වයි. කැල එරබඳු ගස නම් කර තිබේ. මෙකී ගසේ මල් තද රත් පැහැයෙන් යුක්තය. (සිංහල අකාරාදිය, 194 පිටුව.) මල් හා වණුක් (රතුපාට මල් වර්ගයකි) කුසුම්භ යන්නට අර්ථ වශයෙන් වනුක්/ඩබරාව යන්න දක්වයි. (ප්‍රනාන්දු 61 පිටුව.) මල් හැර අනෙක් මල් වර්ග සිවුර පඬු පෙවීමට සුදුසුය. කිංසුකපුප්ඵඤ්ච කුසුම්භපුප්ඵඤ්ච ඨපෙත්වා සබ්බං පුප්ඵරජනං වට්ටති. (සමන්තපාසාදිකා 835 පිටුව.) සෑම ගෙඩි වර්ගයක් ම සිවුරු පඬු පෙවීමට සුදුසුය. ඵලරජනෙ පන න කිඤ්චි න වට්ටති. (සමන්තපාසාදිකා 835 පිටුව.) වර්තමානයෙහි පඬු සකස් කර ගැනීම සඳහා මහෝගනී පොතු, කඳ, මුල් ද වරකා ගසේ අරටු, මුල් ද දමන පොතු, නුග පොතු, කුඹුක් පොතු, දඹ පොතු ආදි භාවිත කරයි. පඬු සකස් කර ගැනීමත් ක්‍රමවත් ව සිදු කළ යුතුය.

**පඬු සකස් කිරීම**

එකල භික්ෂූන් වහන්සේ උණු නො කළ පඬු වලින් සිවුරු පඬු පෙවූ අතර එයින් සිවුරු දුගඳ හමන්නට විය. මේ කරුණ බුදුරදුන්ට දැන්වූ කල්හි පඬු උණු කිරීමට අනුදැන තිබේ. අවශ්‍ය කරන පොතු හා කොළ වර්ග කැලිවලට කපා ගෙන හැලියක දා තබබා ගත යුතුය. ඉන්පසු වතුර පෙරාගෙන පඬු ගැසීම සිදු කළ යුතුය. සිවුරු පඬු පෙවීම මුල් කොට ගෙන බුදුරදුන් ඊට අවශ්‍ය කරන උපකරණ කීපයක් අනුදැන තිබේ.

චුල්ලි - රජනකුම්භි - උඳුන හා පඬු හැළිය

රජනුලුඞ්කං - දණ්කථාලිකං - පඬුකිණ්ස්ස හා දණ්ඩෙන් කළ හැන්ද

රජනකොළම්බං - රජනඝටං - මහාපඬුහැළිය හා පඬුකළය

රජනදොණිකං - පඬුඔරුව

සිවුරු පඬු පෙවීම සඳහා අවශ්‍ය වන උපකරණ කීපයකි. සාමාන්‍යයෙන් සිවුරක් පඬු පෙවීමේ දී සිවුර දිග් අතට නමා රවුම් කොට ඉහළ කෙළවරේ සිට පඬු පෙවීම සිදු කරනු ලබයි. එසේ නැත්නම්, සිවුරේ කොණක සිට පඬු පෙවීම සිදු කරයි. ඉන් පසුව බෝමු කොළ තැම්බූ වතුරෙන් සොදා ගැනීම ද සිදු කරනු ලබයි. සිවුරේ නුවා කෙළවර මොනර ඇසක ප්‍රමාණයට කප් බිංදු තැබීමෙන් පසු චීවර නාමයෙන් හඳුන්වයි.

**චීවර අධිෂ්ඨානය**

සිවුරක් වශයෙන් කිසියම් වස්ත්‍රයක් ලැබුවේ නම් එකී වස්ත්‍රය චීවර නමින් හඳුන්වයි. චීවරය භික්‍ෂුවට පරිහරණය කළ හැක්කේ, අධිෂ්ඨාන හෝ විකප්පනය කිරීමෙන් පසුවයි. අධිෂ්ඨාන හෝ විකප්පන නොකර දස දිනයක් ඉක්මමෙන් නිස්සග්ගිය ආපත්තියට පත්වෙයි. අනුජානාමි භික්ඛවෙ තිචීවරං අධිට්ඨාතුං, න විකප්පෙතුං වස්සිකසාටිකා වස්සානං චාතුමාසං අධිට්ඨාතුං, තතො පරං විකප්පෙතුං. නිසීදනං අධිට්ඨාතුං, න විකප්පෙතුං. පච්චත්ථරණං අධිට්ඨාතුං, න විකප්පෙතුං, කණ්ඩුපටිච්ඡාදිං යාව ආබාධා අධිට්ඨාතුං, තතො පරං විකප්පෙතුං. මුඛපුඤ්ජනචොළකං අධිට්ඨාතුං, න විකප්පෙතුං. පරික්ඛාරචොළකං අධිට්ඨාතුං, න විකප්පෙතුං (මහාවග්ගපාළි 726 පිටුව.) චීවරය අත්පසෙහි ඇති නම් වචනයෙන් අධිෂ්ඨාන කළ හැකිය. චීවර අධිෂ්ඨානයේ දී තුන් සිවුර වෙන වෙන ම අධිෂ්ඨාන කළ යුතුය. ඉමං සංඝාටිං අධිට්ඨාමි, ඉමං උත්තරාසංඝං අධිට්ඨාමි, ඉමං අන්තරාවාසිකං අධිට්ඨාමි (විනයාලංකාර ටීකා, 73 පිටුව.) යනුවෙන් දෙපට සිවුර, තනිපට සිවුර හා අඳන සිවුර අධිෂ්ඨාන කළ යුතුය. එක සිවුරකට තුන් වතාවක් අධිෂ්ඨාන වාක්‍ය ප්‍රකාශ කළ යුතුය. චීවරය අධිෂ්ඨානය බිඳීයන්නා වූ කරුණු නවයක් දැක්වෙයි.

01. අන්‍යයන්ට ලබා දීම

02. සොරු පැහැර ගැනීම

03. අන්‍යයන් විසින් විශ්වාසය තබා ගැනීම

04. උපැවිදි වීම

05. ශික්ෂාව ප්‍රතික්ෂේප කිරීම

06. මරණය

07. ලිංග පර්වර්තනය

08. පච්චුද්ධාරණය

09. ඡිද්ද ඇතිවීම

චීවරයෙහි ඡිද්ද හෙවත් සිදුරු ඇතිවීමෙන් අධිෂ්ඨානය බිඳෙයි. අනෙක් කරුණු අට සියලු දෑ කෙරෙහි අධිෂ්ඨානය බිඳීම කෙරේ බලපානු ලබයි.

**චීවර විකප්පනය**

අතිරේක වශයෙන් තමාට අයත් දෑ අනෙකාට දීම විකප්පනය නම් වෙයි. එකී දීම සම්පූර්ණ වශයෙන් පවරාදීමක් අතහැරීමක් අයිතියට දීමක් නොවේ. විකප්පනය වනාහි විනය කර්මයකි. චීවරයක් විකප්පනය කරන්නේ නම් සිවුර ඒකාංශ කොට පොරවා උක්කුටියෙන් හිඳ විකප්පනය කරන්නා වූ චීවරය අතට ගෙන විකප්පන කරයි. ඉමං චීවරං තුය්හං විකප්පෙමි. මෙම වාක්‍ය තෙවරක් ප්‍රකාශ කොට චීවරය දෙනු ලබයි. ඉන්පසු චීවරය තමා සන්තකයේ තබාගැනීමෙන් නිස්සග්ගිය ආපත්තිය සිදු නොවෙයි. චීවරය විකප්පනය කළ භික්ෂුව විසින්, මයිහං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහි. ආපසු දීම පච්චුද්ධාරණය නම් වෙයි. ආයුෂ්මත් උපනන්ද තෙරුන්ගේ සහෝදරයාගේ සද්ධිවිහාරික භික්ෂූහු චීවරය විකප්පනය කොට පච්චුද්ධාරණ නොකොට පරිභෝග කරන්නට වූහ. මේ හේතුවෙන් පාචිත්තිය ආපත්තිය පනවා තිබේ. යො පන

භික්ඛු භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණේරස්ස වා සාමණේරියා වා සාමං චීවරං විකප්පෙත්වා අප්පච්චුද්ධාරණං පරිභුඤ්ජෙය්‍ය, පාචිත්තියන්ති. (පාචිත්තිපාළි 226 පිටුව.) සිවුපස පරිභෝජනයේ දී අධිෂ්ඨාන, විකප්පන හා පච්චුද්ධාරණය කළ යුතුය. ඉන් සිවුපස පරිභෝජනය සිද්ධියට පත්වෙයි.

**චීවර පරිහරණය**

මුල් කාලීන භික්ෂුව කඩ නො කැපූ රෙදි සිවුරු පිණිස භාවිත කොට තිබේ. පසු කාලයේ දී බුදුරජාණන් වහන්සේ කඩකැපූ සිවුර භාවිතය අනුදැනීම සිදු කළහ. සාමාන්‍යයෙන් ව්‍යවහාර කරන්නේ තුන් සිවුර යනුවෙනි. ඒ දෙපට සිවුර (සංඝාටි) තනිපට සිවුර (උත්තරාසංග) අඳනය (අන්තරාවාසික) යනුවෙන් විනය තුළ භාවිත වෙයි. මේ තුන් සිවුර ම කඩකපා මසා භාවිත කළ යුතු වේ. අනුජානාමි භික්ඛවෙ ඡින්නකං සංඝාටිං ඡින්නකං උත්තරාසංගං ඡින්නකං අන්තරාවසකන්ති. (මහාවග්ගපාළි 708 පිටුව.) රෙදි වර්ගය, වර්ණය, පඩු පෙවීම, අධිෂ්ඨානය, විකප්පනය හා පච්චුද්ධාරණය ආදිය තුන් සිවුරට ම පොදු කාරණ වෙයි. දෙපොට සිවුර නැතිව භික්ෂුවට ගමට පිවිසීම දුක්කටාපත්තියකි. න භික්ඛවෙ සන්තරුත්තරෙන ගාමො පවිසිතබ්බො, යො පවිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස. (මහාවග්ගපාළි 728 පිටුව.) එක්තරා භික්ෂුවක් සංඝාටිය අන්ධවනයෙහි තබා පිණ්ඩපාතය පිටත් වූ කල්හි සංඝාටිය සොරු විසින් ගන්නා ලදී. ඒ හේතුවෙන් මේ ශික්ෂා පදය පනවා තිබේ. එනමුත් සංඝාටිය සමීපයෙහි නැතිව රාත්‍රි ඉක්මවීමට හැකි කරුණු පහක් වෙයි.

01. ගිලනෙකු වීම

02. වැසි ලකුණු තිබීම

03. ගඟකින් එතෙර වන්නට වීම

04. දොරගුළු සහිත විහාරක් වීම

05. කඨිනස්ථාරිත භික්ෂුවක් වී මග පඤ්චිමෙ, භික්ඛවෙ, පච්චයා සඞ්ඝාටියා....උත්තරාසඞ්ග.....වස්සිකසාටිකාය නික්ඛෙපාය ගිලානො වා හොති, නදීපාරගතං ගන්තුං වා හොති, අග්ගළගුත්තිවිහාරො වා

හොති. (මහාවග්ගපාළි, 728 පිටුව.)

තුන් සිවුරෙන් භික්ෂුව ගම්‍ය වෙයි. සිවුර භාවිතයේ දී භික්ෂුව විසින් සිවුර පරිභෝග කරන්නේ කුමක් සඳහා ද යන්න සිහි කළ යුතුය. එය හඳුන්වන්නේ චීවර ප්‍රත්‍යවේක්ෂා යනුවෙනි. ශීතෝෂ්ණ නැසීම පිණිස ඇට ලේ මැස්සන් මදුරුවන් සර්පයන් අවු වැසි සුළං හානි වැළකීම පිණිස ලැජ්ජාව සහිත ස්ථාන වසා ගැනීමට පිණිස සිවුර පරිභෝග කරන බව සිහි කිරීම, යං වො මයා චීවරං අනුඤ්ඤාතං, අලං වො තං යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතපසරීසප සම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව හිරිකොපීනපටිච්ඡාදනත්ථං. (දීඝනිකාය, 216 පිටුව.) චීවර පරිහරණයේ දී වැදගත් වෙයි.

**සුගත චීවරය**

බුදුරදුන්ගේ චීවර ප්‍රමාණය වෙනස් වේ. දිගින් සුගත වියත් නවයක් හා පළලින් සුගත වියත් හයකි. සුගතචීවරං නාම දීඝසො නව විදත්ථියො සුගතවිදත්ථියා තිරියං ඡවිදත්ථියා (පාචිත්තිපාළි, 460 පිටුව.) දිග අගල් 243 කි. පළල අගල් 162 කි. සුගත චීවර ප්‍රමාණයේ සිවුරු දැරීම භික්ෂුවට දුක්කාටපත්ති බව දැක්වේ. බුදුරදුන් දෙව්රම් විහාරයෙහි වාසය කරන කාලයේ නන්ද තෙරුන් සුගත චීවරය ප්‍රමාණයේ චීවරයක් පෙරවන්නේ විය. නන්ද තෙරුන් යම් තැනකට පැමිනීමේ දී එහි වැඩ වාසය කළ ස්ථවිර භික්ෂූණ් වහන්සේ බුදුරදුන් වඩිනවායැයි සිතා හුනස්නෙන් නැගිට ගරු සරු දක්වන්නට වූහ. වඩින්නේ බුදුරදුන් නොවන බව දැනගත් ස්ථවිර භික්ෂූහු නුගුණ කීම හා අප්‍රසාද පළ කළහ. එහි දි බුදුරදුන් සුගත චීවරයේ ප්‍රමාණයෙන් චීවර සකස් කිරීම නුසුදුසු බව අවදාළහ. බුදුරදුන්ගේ සිවුරේ ප්‍රමාණයට භික්ෂූන් සිවුරු සකස් වන්නේ නැත. සුගත චීවරයේ ප්‍රමාණ ආදිය වෙනස් වෙයි.

**චීවර (උත්තරාසංගය) මැසීමේ ප්‍රමාණ**

චීවර මැසීමේ දි පළමුව වස්ත්‍ර මැන ගැනීම සිදු කළ යුතු ය. සාමාන්‍යයෙන් චීවර මැසීම සඳහා එය පරිභෝග කරන භික්ෂුවගේ මිම්ම ලබා ගත යුතුය. අතේ මැදගිල්ලේ අග සිට වැලමිට සන්ධියේ මුල් දක්වා වූ ප්‍රමාණය ගනී. එකී ප්‍රමාණය හතරෙන් වැඩි කොට ඊට

අඟල් තුනක් කැපුම් වාසිය ලෙස එක් කොට චීවරයේ උස ප්‍රමාණය කරයි. චීවරයේ පළල අතේ දිග ප්‍රමාණයේ පහෙන් වැඩි කර ගැනීම වර්තමාන චීවර මැසීම දි සිදු කරයි. ඒ අනුව පස් කඩ සත් කඩ වන රෙදි කපා චීවර මසයි. විනයෙහි චීවර මැසීම පිළිබඳ දක්වා ඇත්තේ සුගත වියත ප්‍රමාණයෙනි. සුගත වියත යනු සුගත විදත්ථි නාම ඉදානි මජ්ඣිමස්ස පුරිසස්ස තිස්සො විදත්ථියො වඩ්ඪකී හත්ථෙන දියඩ්ඪො හත්ථො හොති (සමන්තපාදිකා) සුගත විදත්ථිය හෙවත් සුගත වියත මධ්‍යම පුරුෂයා ගේ අතින් වියත් තුනක් හෝ වඩුරියන් එක් හමාරකි. සාමාන්‍ය වියතයකට අඟල් නවයකි. අඟල් 27 සුගත වියතකි. වඩු රියනට අඟල් 32 කි. වඩු රියන් එක හමාරක් යනු අඟල් 47 හමාරකි. වියත් දෙකක් රියනකි. එනම් අඟල් 18කි. චීවරය පරිභෝග කරන භික්ෂුවගේ රියනේ ප්‍රමාණයෙන් මැණ ගැනීම වඩාත් ප්‍රායෝගික වේ. සංඝාටිය හෙවත් දෙපට චීවර සඳහා ප්‍රමාණ තනි පට චීවරයේ ප්‍රමාණය ගන්නා සේ ම ය.

## අඳන (අන්තරවාසක) චීවරය

තුන් සිවුර සම්පූර්ණ වන්නේ අඳන සිවුර තුළනි. මෙය විනයෙහි දක්වා ඇත්තේ අන්තරාවාසක යනුවෙනි. අන්තරවාසය මැසීමේ දි එය පාවිච්චි කරන්නාගේ ප්‍රමාණයට මැසීම වඩාත් උචිත වේ. දෙරියනක් හෝ දෙරියන් හමාරක් වන මැසීම සුදුසු බව ශාසනාවතරණය දක්වයි. අඳන සිවුර ද වස්ත්‍ර කපා මැසිය යුතුය. ජින්නකං අන්තරාවාසකං (මහාවග්ගපාළි II, 708 පිටුව) භික්ෂුවගේ යටි කය ප්‍රදේශය සඳහා පොරවන්නේ අඳන සිවුරයි. එය සකස් වන්නේ ද චීවරයෙහි කඩ කැපුම් හා මැසුම් ක්‍රමය අනුවය.

## වස්සිකසාටික හා උදකසාටිකය

වැසි සළුව වස්සික සාටික නමින් හඳුන්වයි. සාම්ප්‍රදායික වස් ආරාධනයේ දි පූජා කරන්නේ වස්සික සාටිකය යි. වස් වාසය කරන සතර මාසයේ ප්‍රයෝජනය සඳහා වස්සික සාටික භාවිත වේ. වස්සිකසාටිකා නාම වස්සානස්ස චතුමාසත්ථා (පාචිත්තියපාළි I, 458 පිටුව) වස්සික සාටිකය සකස් කිරීමේ දි අනුගමනය කළ යුතු ක්‍රමවේදයක් විනයෙහි අනුදැන තිබේ. වස්සිකසාටිකං පන භික්ඛුනා කාරයමානෙන පමාණිකා කාරෙතබ්බා. තත්‍රිදං පමාණං දීඝසො

ඡවිදත්ථියො සුගතවිදත්ථියා තිරියං අඩ්ඪතෙය්‍යා තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියන්ති (පාචිත්තියපාළි I, 458 පිටුව) වස්සික සාටිකය දිගින් සුගත් වියතින් හයකි, පළලින් සුගත් වියත් තුනකි. එකී ප්‍රමාණය ඉක්මවා වස්සික සාටියක මැසීම පචිති වේ. බුදුරදුන් ජේතවනයෙහි වාසය කරන අවස්ථාවක එක දිනක් වර්ෂාවක් ඇති විය. එම වර්ෂාව සිවුදිවයින්ට ම එක විට වර්ෂාව ඇති බවත් එසේ වසින්නා වූ අන්තිම වර්ෂාව බවත් බුදුරජාණන් වහන්සේ වදාළ සේක. එබැවින් භික්ෂූන්ට එකී වර්ෂාවෙන් ස්නානය කිරීමට වදාළහ. එවිට භික්ෂූන් වහන්සේ සිවුරු තබා ස්නානය කරති. මෙදින විශාකාවෝ බුද්ධ ප්‍රමුඛ මහාසංඝයා විෂයෙහි දානයට ආරාධනා කොට තිබූ දියක් විය. බැවින් දානයට කල් පැමිණි බව විහාරයට ගොස් දන්වා එන ලෙස ස්වකීය සේවිකාවට විශාකාවෝ දැන්වූහ. විහාරයට ගිය සේවිකාව දක්නා ලද්දේ විහාරයෙහි ආජීවකයන් පිරිසක් ස්නානය කරන ආකාරයකි. සේවිකාව විශාඛාවන්ට ප්‍රකාශ කරන්නේ විහාරයෙහි භික්ෂූන් වහන්සේ නොමැති බවත් එහි ආජීවකයන් පිරිසක් ස්නානය කරන බවත් ය. මෙම සිද්ධිය හේතුවෙන් භික්ෂූණ්ට වස්සික සාටිකය අනුදැන තිබේ. අචිරවතී නදියෙහි වෙසඟනන් සමග නග්නව දිය ස්නානය කළ මෙහෙණියෝ හේතුවෙන් ඒ අයට දිවි ඇතිතාක් කල් උදකසාටිකාව අනුදැන තිබේ. (මහාවග්ගපාළි II, 718 පිටුව) ස්නානයේ දි මෙහෙණන්ට භාවිත කිරීම සඳහා උදකසාටිකාව ප්‍රයෝජනවත් වේ.

**සමාලෝචනය**

ගිහිගෙයින් නික්ම ඔබසර වැසීම සඳහා සසුනට පත් පැවිද්දා විසින් චීවර පරිහරණය කළ යුතුය. සසර දුක නැති කිරීම සඳහා පහසුවෙන් පරිභෝ කළ හැකි පොරෝනයක් වශයෙන් චීවර අනුදැන තිබේ. එහි ප්‍රමාණය, වර්ණය ආදියෙන් ශරීර සෞඛ්‍යය ආදියට හිතකර වේ. අල්පේච්ඡ බව ඇති වන ආකාරයට චීවරයෙහි සැකැස්ම හා නිමාව පෙන්වා දී තිබේ. විනයානුකූල දිවියට චීවරයෙන් පලිබෝධ අවම වේ. චීවරය කැප ආකාරයට සකසා ගැනීම දුෂ්කර කාර්යයක් වුවත් විමුත්තිගාමීත්වයට හේතු වේ. පරම සුඛය වූ නිවන සඳහා පැවිද්දාගේ පාරුපනය සිදු වන්නේ හුදෙක් අලංකාරය සඳහා නොව කායික යාපනය සඳහා ය. කැප ආකාරයට චීවර පරිහරණය පැවිද්දා විසින් යාවජීවය සිදු කළ යුත්තකි. පැවිදි දිවිය යනු අල්ප ආශා අල්ප

කෘත්‍ය සහිත පැවැත්මකි. තාක්ෂණය සමාජය දිවුණු වුව ද පැවිද්දාගේ චීවර පිළිබඳ විනය ප්‍රඥප්තිවලින් බැහැරව ක්‍රියාත්මක විය නොහැකි ය. ඊට සරළ භාවිතයන් අදේශ කළ නොහැකි ය. දුක නැති කිරීමේ මාර්ගයට ප්‍රවේශ වන්නේ තමාගේ අභිමතය අනුව බැවින් සිවුපස පරිභෝජනයෙහි අංගයක් වූ චීවර පරිභෝජනය කෙරෙහි පැවිද්දා විසින් අනුගමනය කළ යුතු ආකාරය විනය දේශනා තුළ අන්තර්ගත වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

සමන්තපාසාදිකා I කොටස, හේවාවිතාරණ මුද්‍රණ, 2014.

විමතිවිනොදනීටීකා, (සංස්:) බෙරතුඩුවේ ධම්මධාරතිස්ස හිමි ලක්ෂ්මන් යන්ත්‍රාලය, කොළඹ, 1935

අපදානට්ඨකථා II කොටස, හේවාවිතාරණ මුද්‍රණ, 2013.

මහාවග්ගපාළි II කොටස, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006.

විසුද්ධිමග්ගය, හේවාවිතාරණ මුද්‍රණ, 1919, . එම, පාපණිකන්ති ආපණ ද්වාරෙ පතිතකං.

සාසනතිලක හිමි, උහන්ඕවිට, මහවග ගැටපදය, මාතර ප්‍රැන්සිස් ජයවික්‍රම විසින් මුද්‍රණය කරන ලදී, 1942.

සෝරත හිමි, වැලිවිටියේ, ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1952.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ, දේශීය වෛද්‍ය ශබ්දකෝෂය, ශාස්ත්‍රෝදය මුද්‍රණාලය, රත්නපුර, 1959.

පාලි සිංහල අකාරාදිය, ඇම්.ඞී. ගුණසේන සහ සමාගම, කොළඹ, 2015.

දීඝනිකාය III කොටස, පාසාදික සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006.

මජ්ඣිම නිකය I කොටස, සබ්බාසව සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006.

අංගුත්තර නිකාය IV කොටස, ආසව සුත්ත, 2006.

මහානිද්දෙසපාළි, සාරිපුත්තනිදදෙසය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව, 2006, 706 පිටුව.